# දොම්පෙ ප්‍රාදේශීය සභාව-කිරිදිවැල
# ලංසු ආරාධනයයි. (2026/01)

01. දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් 2026 බස්නාහිරපළාත් සභා ක්‍රියාත්මක වැඩ සටහන , ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන හා සභා අරමුදල් යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට අයත් පහත දැක්වෙන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02.

| අනු අංකය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල (රු) | කොන්ත්‍රාත් ලියාපදිංචිය | කොන්ත්‍රාත් කාල සීමාව | ලංසු සුරක්ෂණය රු. |
|---|---|---|---|---|---|---|
| 01. | N 267152311505 | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 421 පට්ටියගම ග්‍රා.නි වසමේ අංක 20 ඩී ගාමිණී මහතාගේ කඩය අසල සිට අංක 20/4/ඒ දීප්ති රත්නායක මහතාගේ නිවස අසල දක්වා පොදු මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 3,200,000.00 | (CIDA) C– 9 හෝ ඉහල (මාර්ග) | දින 60 | 32,000.00 |
| 02. | U 268152311001 | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 394 මණ්ඩාවල උතුර ග්‍රා.නි.ව ජයදේව මාවත අක්කර නමය බෝධිය අසල සිට අංක 225 ප්‍රධාන බස් මාර්ගය දක්වා කොන්ක්‍රීට් කිරීම් | 3,000,000.00 | (CIDA) C– 9 හෝ ඉහල (මාර්ග) | දින 60 | 30,000.00 |
| 03. | U 266152311001 | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 382 වේරහැර කන්දගොඩැල්ල මාර්ගයේ පැති බැම්ම බැද පාර කොන්ක්‍රීට් කිරීම | 2,880,000.00 | (CIDA) C-9 හෝ ඉහල (මාර්ග) | දින 90 | 28,800.00 |
| 04. | U 268152311005 | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 398 ඒ කන්නිමහර නුගගහවත්ත (කිරාලවත්ත ) මාර්ගය අවසානයේ රෝහිණී මල්ලිකා මහත්මියගේ නිවස අසල සිට ආරම්භය දෙසට සපත්තු කාණු යොදා කොන්ක්‍රීට් කිරීම | 4,000,000.00 | (CIDA) C– 9 හෝ ඉහල (මාර්ග) | දින 90 | 40,000.00 |
| 05. | U 268152311006 | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 380 සී දංගල්ල උතුර ග්‍රාම නිළධාරී වසමේ පාසැල් මාවත තාර යොදා සංවර්ධනය කිරීම | 2,240,000.00 | (CIDA) C– 9 හෝ ඉහල (මාර්ග) | දින 60 | 22,400.00 |
| 06. | U 268152311008 | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 411 පාලුගම වසමේ ගලකොන සිට ලංසියහේන පාරේ විජයරත්න මහතාගේ නිවස අසල සිට සත්මිණි උයනේ ගලේවත්තට හැරෙන පාර දක්වා මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 5,300,000.00 | (CIDA) C– 8 හෝ ඉහල (මාර්ග) | දින 60 | 53,000.00 |
| 07. | U 266152311003 | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැදුන්ගොල්ල උතුර වත්තේ කඩේ පාරේ කාණු පද්ධනිය සංවර්ධනය කිරීම | 8,840,000.00 | (CIDA) C– 8 හෝ ඉහල (මාර්ග) | දින 90 | 88,400.00 |
| 08. | U 268152311007 | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 405 බී දේගවත්ත ග්‍රා.නි.ව කොස්රුප්පවත්ත අතුරු මාර්ගය අංක186 නිවස අසල සිට පාලුගම අශෝක කඩය අසල දක්වා කොන්ක්‍රීට් කිරීම සහ අංක 184 නිවස සිට කොස්රුප්පවත්ත මැදයාය පාරේ ඉතුරු කොටස කොන්ක්‍රීට් කිරීම | 2,700,000.00 | (CIDA) C– 9 හෝ ඉහල (මාර්ග) | දින 60 | 27000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 09. | DOM/RRDP/17/39/81/6/2026 | 395 බී කුරුදුහේන හිලරියන් පාම් ජනපදයේ 39/18 පී ජී ප්‍රියන්ත සුමිත් කුමාර මහතාගේ නිවස අසල සිට සුසාන භූමිය දෙසට ඇති පාර කොන්ක්‍රීට් කිරීම | 2,200,000.00 | (CIDA) C– 9 හෝ ඉහල (මාර්ග) | දින 60 | 22,000.00 |
| 10. | DOM/RRDP/17/39/81/7/2026 | 397 ඒ නාකදපොළ හේනේගම ප්‍රධාන පාරේ සිට මඩපොලවත්ත පාර කොන්ක්‍රීට් කිරීම | 2,300,000.00 | (CIDA) C– 9 හෝ ඉහල (මාර්ග) | දින 60 | 23,000.00 |
| 11. | DPS/H/C/2/2/03/2026 | මැද්දේගම පොදු සුසාන භූමියෙහි හිස්සැල්ල ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති මායිමෙහි වැට සකස් කිරීම | 5,000,000.00 | (CIDA) C– 8 හෝ ඉහල (ඉදිකිරීම) | දින 90 | 50,000.00 |

03.ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුව ලංසු කැඳවනු ලැබේ.

04. රජයේ කාර්යාල වැඩ කරන දිනයන්හි පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා කාලය තුළ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ කිරිදිවැල ප්‍රධාන කාර්යාලයේ කර්මාන්ත අංශයට පැමිණ ලංසුලේඛන පරීක්ෂා කර බැලිය හැකි අතර ,මේ සම්බන්ධව වැඩිදුර විස්තර පැහැදිලි කර ගැනීමට දුරකථන අංක 0781515115 මගින් සභාවේ වැඩ අධිකාරී මහතා විමසා දැනගත හැකිය.

05. 2026-06-11 දින ප.ව. 2.00 දක්වා මෙම සභාවේ කර්මාන්ත අංශයට පැමිණ ලංසු ලේඛන ලබාගත හැකිය.

06. ලංසු ලේඛන ලබා ගැනීම සදහා ලිඛිත ඉල්ලීමක් සමග ජාතික හැදුනුම්පත හෝ පිළිගත් හැදුනුම්පතක් ඉදිරිපත් කල යුතු අතර, ආපසු නොගෙවන රුපියල් 3,500.00 ක ලංසුලේඛන ගාස්තුවක් ගෙවිය යුතුය.

07. සියලුම ලංසු සමඟ " සභාපති දොම්පෙ ප්‍රාදේශීය සභාව ''නමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි , පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් 2026.08.31 දින දක්වා වලංගු කොන්දේසි විරහිත,ඉල්ලූවිට ගෙවන ලංසු සුරක්ෂණයක් ඉදිරිපත්කිරීම හෝ එම මුදල මුදලින් සභාවට තැන්පත් කිරීම හෝ සිදුකළ යුතුය.

08. ලංසු මුල් පිටපත් සහ අනු පිටපත් ලෙස පිළියෙල කර ලංසු බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ව්‍යාපෘතියේ නම සදහන් කර 2026-06-12 දින පෙ.ව 10.00 පෙර ලැබෙන සේ "සභාපති, දොම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිදිවැල" ලෙස ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ලේකම්තුමාගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය යුතුය.

09. පමා වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ලංසු භාරගන්නා වේලාව ඉක්ම වූ වහාම දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී ලංසු විවෘත කරන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයකුට සහභාගී විය හැකිය.

11. යම් ලංසුවක් පිළිගැනීම හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ බලය දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව
2026.05.27